# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 2 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 2 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 14 වන දින]

එල්. ඩී.—ඕ. 8/69.

ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතනය නීතිගත කිරීම පිණිසත් කොළඹ ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයට ද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ද ශ්‍රී ලංකා නාවික හමුදාවට හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ද අයත් තැනැත්තන්ට සමාජශාලා ජීවිතයේ සැප පහසුකම් සලස්වා දීම පිණිසත් ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 2 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් අමාත්‍ය වරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතනය පිහිටුවීම සහ නීතිගත කිරීම.

2. (1) මේ පනතෙහි මින් මතු විධිවිධාන සැලැස්වෙන පරිදි භාරකරුවන් නව දෙනකුගෙන් සමන්විත වූ හා ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද මේ පනතෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද මණ්ඩලයක් පිහිටුවනු ලැබේ.

(2) පහත සඳහන් පරිදි පත් කරනු ලබන භාරකරුවන් නව දෙනකුගෙන් ආයතනය සමන්විත විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් භාරකරුවෙක් ;

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව නියෝජනය කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් භාරකරුවෙක් ;

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් භාරකරුවෙක් ;

(ඈ) ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය නියෝජනය කිරීම පිණිස ඒ සංගමය විසින් පත් කරනු ලබන භාරකරුවන් සිව් දෙනෙක් ; සහ

(ඉ) ඇමතිවරයා විසින් පත් කරනු ලබන භාරකරුවන් දෙදෙනෙක්.

(3) (1) වන උපවගන්තියෙන් ආයතනයට දෙන ලද නාමයෙන් ආයතනය සංස්ථාවක් වේ. අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් එයට තිබෙන අතර ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි වේ.

(4) (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් භාරකරුවකු මිය ගියහොත් හෝ තුන් මසකට වැඩි කාලසීමාවක් ශ්‍රී ලංකාවෙන් බැහැර සිටියහොත් හෝ ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ භාරකරුවකු වශයෙන් කටයුතු කිරීමට අපොහොසත් බවට පත් වුවහොත් හෝ ඒ භාරකරු පත් කළ තැනැත්තා හෝ

ෂ් 18368—9,054 (72/12)

මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි ඒ පත්වීම අවලංගු කළහොත් ඒ පුරප්පාඩුව පිරවීම පිණිස වෙනත් භාරකරුවකු ඉහත කී ආකාරයෙන්ම පත් කරනු ලැබිය යුතු ය.

ආයතනයේ පරමාර්ථ.

3. ආයතනයේ පරමාර්ථ පහත දැක්වෙන කරුණු වේ:—

(අ) (i) ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයන්;

(ii) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සාමාජිකයන්;

(iii) ආයතනයේ භාරකරුවන්ගේ අභිමතය පරිදි වෙනත් වර්ගවල තැනැත්තන්

යන මොවුන්ට ආයතනය තුළ සමාජශාලා ජීවිතේ වර ප්‍රසාද සලස්වාදීම;

(ආ) ආයතනයේ ප්‍රධාන ශාඛාවක් කොළඹ ද ආයතනයේ භාරකරුවන්ගේ අභිමතය පරිදි ආයතනයේ අතිරේක ශාඛා ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථානවල ද පිහිටුවා පවත්වා ගෙන යාම; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සාමාජිකයන්ගේ හෝ ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයන්ගේ හෝ (අ) ඡේදයේ (iii) අනුඡේදයෙහි සඳහන් වර්ගවල තැනැත්තන්ගේ සුභසිද්ධියට කටයුතු සැලැස්වීම එකම පරමාර්ථය හෝ එක් පරමාර්ථයක් වශයෙන් ඇතිව පවත්වා ගෙන යනු ලැබේ ය යි ආයතනයේ භාරකරුවන් අදහස් කරන ශ්‍රී ලංකාවේ කවර ස්ථානයක වුව ද පිහිටි සමාජ ශාලා, සංගම් සහ වෙනත් එවැනි ආයතනවලට මුදල් ප්‍රදානය කිරීමෙන් හෝ අන් ලෙසකින් ආධාර දීම.

ආයතනය විසින් කළමනාකාරිත්වය හා පාලනය ගෙන යෑම.

4. ආයතනයේ ශාඛා සියල්ලක් ද ඇතුළත් එහි සම්පූර්ණ පාලනයට හා කළමනාකාරිත්වයට ආයතනයේ භාරකරුවන් වග කිව යුතු අතර ඒ පාලනයේ හා කළමනාකාරිත්වයේ කාර්යයන් සඳහා සුදුසු ය යි ඔවුන් සලකන රීති සෑදීමේ බලය ඔවුන්ට තිබේ.

වර්ණ, ආගම් ආදි භේද ආයතනය විසින් නොතැකිය යුතු බව.

5. වර්ණ, ජාති හෝ ආගම් පිළිබඳ කිසිදු භේදයක් නොමැතිව ආයතනය පවත්වා ගෙන යා යුතු ය.

දේපළ සතුව තබා ගැනීම, ත්‍යාග පිළිගැනීම ආදිය සඳහා ආයතනයට බලය තිබිය යුතු බව.

6. යම් නීතියක විධිවිධාන ප්‍රකාර හෝ යම් මිලට ගැනීමක, ප්‍රදානයක, ත්‍යාගයක, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක ප්‍රකාර හෝ අන් ලෙසකින් ආයතනය වෙත සතු විය හැකි චංචල හෝ නිශ්චල යම් දේපළක්, මේ පනතෙහි කාර්යයන් සඳහා ලබා ගැනීම හා සතුව තබා ගැනීම ආයතනය විසින් කළ හැකි අතර ඒ දේපළට බලපාන යම් භාරයකට යටත්ව ඒ දේපළ ඉහත කී කාර්යයන් සඳහා විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ ඒ පිළිබඳව අන් ලෙසකින් කටයුතු කිරීම ද ආයතනය විසින් කළ හැකි ය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ අර්ථ නිරූපණය. පනතෙහි "ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව; හෝ

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව; හෝ

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අදහස් වේ.